රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 7/2009

මගේ අංකය : ආ/7/4/2/13
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07
2009.03.24

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු,
පළාත් ප්‍රධාන ලේකම්වරු,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**වෘත්තීය සමිතියක හෝ වෘත්තීය සමිති සම්මේලනයක හෝ වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගී වන සාමාජිකයන්ට ඊට සහභාගීවීම සඳහා දුම්රිය ගමන් බලපත්‍ර වෙනුවට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථවල ගමන් කිරීම වෙනුවෙන් වියදම ප්‍රතිපූර්ණය කිරීම**

1997.03.04 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 19/96(1) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. රජය පිළිගත් වෘත්තීය සමිතියක හෝ සම්මේලනයක සාමාජිකයෙකුට සිය සමිතියේ හෝ සම්මේලනයේ හෝ වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගීවීම සඳහා දුම්රිය බලපත්‍ර කට්ටලය ලබාදීම වෙනුවට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථවල ගමන් කිරීම වෙනුවෙන් වියදම ප්‍රතිපූර්ණය කිරීමට රජය තීරණය කර ඇත.

03. ඒ අනුව ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 2 වන වගන්තියට පහත සඳහන් උප වගන්තිය එකතුකර සංශෝධනය කරනු ලැබේ.

2.1.1 වෘත්තීය සමිතියක වාර්ෂික මහා සභාවකට සහභාගීවීම සඳහා හිමිකම් ලබන නිලධාරියෙකු පෞද්ගලිකව ඉල්ලුම් කරනු ලබන අවස්ථාවන්හිදී නිදහස් දුම්රිය බලපත්‍ර කට්ටලය ලබාදීම වෙනුවට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථවල ගමන් කිරීම වෙනුවෙන් වූ වියදම ප්‍රතිපූර්ණය කළ හැකිය.

04. තවද එම පරිච්ඡේදයේම 6 වන වගන්තියට පහත සඳහන් උපවගන්තිය එකතුකර සංශෝධනය කරනු ලැබේ.

6.4.1 එවැනි නිලධාරීන් පෞද්ගලිකවම ඉල්ලුම් කරනු ලබන අවස්ථාවන්හිදී, වාර්ෂික මහ සමුළුවට සහභාගීවීම සඳහා නිදහස් දුම්රිය බලපත්‍ර කට්ටලය වෙනුවට, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථවල ගමන් කිරීම වෙනුවෙන් වූ වියදම ප්‍රතිපූර්ණය කළ හැකිය.

ඩී. දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය